# සංශෝධිත නිවේදනය

**ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය**

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ආශ්‍රිත නිලධාරි III ශ්‍රේණියේ බුද්ධිමය දේපළ නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024

2024.06.28 දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ආශ්‍රිත නිලධාරි III ශ්‍රේණියේ බුද්ධිමය දේපළ නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024 විභාග නිවේදනයේ 01 හා 02 ඡේදයන් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

01. අයදුම් කිරීමේ සුදුසුකම්

1. අයදුම්පත් කැඳවීමේ දිනට වයස අවුරුදු 21ට නොඅඩු අවුරුදු 35ට නොවැඩි පහත සඳහන් සුදුසුකම් සහිත උපාධිධාරීන්ට හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ වසර 05කට නොඅඩු සේවා පළපුරුද්දක් සහිත සංවර්ධන නිලධාරීන්ට උපරිම වයස් සීමාව නොසළකා මේ අවස්ථාවට පමණක් විභාගය සඳහා අයදුම් කළ හැක. (රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග පරිදි)

   i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී/නීතිවේදී හෝ වාණිජවේදී උපාධියක් ලබා තිබිය යුතුය.

   ii. ඉංග්‍රීසි භාෂාව හා පරිගණක දැනුම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

02. විභාග කොන්දේසි :
අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.donenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications - Recruitment Exams/E. B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2024 අගෝස්තු මස 15 වැනි දින රාත්‍රී 9.00** දක්වා දීර්ඝ කෙරේ.

විභාගයට අයදුම් කිරීම සඳහා 2024.06.28 දින ගැසට් පත්‍රයේ සඳහන් අනෙකුත් කොන්දේසි නොවෙනස්ව පවතී.

ගීතාංජලී ආර්. රණවක,
බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය.